සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 13 - 2024**

විභාග අංකය: ....................................

# ගිණුම්කරණය - I

**කාලය පැය 02 යි**

<u>උපදෙස්:-</u>

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු හතර බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

---

(01) පොදු පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශන නිවැරදිවේද?

A. මෙම ප්‍රකාශන ප්‍රධාන වශයෙන් ආයතනයක අතීත මූල්‍ය තොරතුරු සපයයි.

B. ගිණුම්කරණ ප්‍රමිත හා නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලගව මෙම ප්‍රකාශන පිළියෙල කරයි.

C. විශේෂිත වූ තොරතුරු අවශ්‍යතා ඇති නමුත්, එම තොරතුරු සපයන ලෙස සමාගමෙන් ඉල්ලා සිටීමේ හැකියාවක් නොමැති පාර්ශවයන් සඳහා මෙම ප්‍රකාශන පිළියෙල කරයි.

1. A පමණි
2. A හා B පමණි
3. A හා C පමණි
4. B හා C පමණි
5. A, B හා C යන සියල්ලම

(...........)

(02) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරුවල දැකිය හැකි ගුණාත්මක ගති ලක්ෂණ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. අදාළ බව හා සන්නසන්දනය කළ හැකි බව
2. අවබෝධ කරගත හැකි බව හා අදාළ බව
3. කාලීන බව හා සත්‍යාපනය කළ හැකි බව
4. විශ්වසනීය නියෝජනය හා කාලීන බව
5. විශ්වසනීය නියෝජනය හා අදාළ බව

(...........)

(03) ආයතනයක් සතු භාවිත අයිතිය ඇති වත්කම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ සටහන් කිරීමට පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?

1. ආරක්ෂණ
2. අනාවරණ
3. යථාරූපී
4. මූල්‍ය මිණුම්
5. ඓතිහාසික

(...........)

- **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 4 හා 5 සඳහා පිළිතුරු සපයන්න.**

එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියා පදිංචි ව්‍යාපාරයක තොග මිල දී ගැනීමක දී පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| 2024.07.20 | ලකුණු කළ මිල රු. 100 000 ක් වූ බඩු තොගයක් රු. 10000 ක වෙළඳ වට්ටමකට යටත්ව, 10% ක VAT සහිතව ණයට මිලට ගන්නා ලදී. |
| 2024.07.23 | මෙම තොගයේ 1/3 ක් හානි වී ඇති නිසා ආපසු යවන ලදී. |
| 2024.07.25 | 6 000 ක වට්ටමකට යටත්ව ණයහිමියා සම්පූර්ණයෙන්ම පියවන ලදී. |

(04) ඉහත ගනුදෙනුවලට අදාළ නිවැරදි මූලාශ්‍ර ලේඛන හා මූලික ලේඛන අනුපිළිවෙල වන්නේ,

| | මූලාශ්‍ර ලේඛන | මූලික පොත් |
|---|---|---|
| 1. | ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය | ගැනුම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය |
| 2. | ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය | ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය |
| 3. | ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය | ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය |
| 4. | ඉන්වොයිසිය, බැරපත, ගෙවීම්, වවුචරය | ගැනුම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය |
| 5. | ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය බැරපත | ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය |

(...........)

(05) ඉහත 2024-07-25 ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයේ නිවැරදිව දැක්වෙන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1. | -60 000 | = | | | -60 000 |
| 2. | -60 000 | = | 6 000 | | -66 000 |
| 3. | -66 000 | = | -66 000 | | |
| 4. | -66 000 | = | | | -66 000 |
| 5. | -66 000 | = | -6 000 | | -60 000 |

(...........)

(06) ඉහත ගනුදෙනු අවසානයේ VAT පාලන ගිණුමේ ශේෂය වන්නේ,

1. රු 3 000 හර
2. රු 9 000 හර
3. රු 9 000 බැර
4. රු 6 000 හර
5. රු 6 000 බැර

(...........)

(07) රුවිනිගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ පහත වෙනස්වීම් සිදුවිය.

| | රු.'000 |
|---|---|
| ජංගම නොවන වත්කම් අගය ඉහළ යාම | 100 |
| ජංගම වත්කම් අගය ඉහළ යාම | 50 |
| ජංගම නොවන වගකීම් පහළ යාම | 50 |
| ජංගම වගකීම් පහළ යාම | 50 |

2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාරය උපයන ලද ලාභය රු. 100 000 ක් නම් වර්ෂය තුළ අයිතිකරු ව්‍යාපාරය සමඟ කළ ගනුදෙනුවල ශුද්ධ බලපෑම වන්නේ,

1. රු 50 000
2. රු (50 000)
3. රු 100 000
4. රු 150 000
5. රු 250 000

(...........)

(08) බැංකුව විසින් රුවන්ගේ ව්‍යාපාරය වෙත එවන ලද 2024 ඔක්තොම්බර් මාසයේ බැංකු ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

- ආරම්භක බැර ශේෂය රු 20 000 යි.
- මාසය තුළ ගෙවන ලද මුළු චෙක්පත් වටිනාකම රු. 70 000 කි. (මෙයින් රු 6 000 ක චෙක්පතක් සැප්තැම්බර් මාසයේ නිකුත් කර ඇත. ඔක්තෝබර් මස නිකුත් කළ චෙක්පත්වලින් 10 000 සඳහා ගෙවීම් කර නැත.)
- මාසය තුළ උපලබ්ධි වූ චෙක්පත් වටිනාකම රු. 50 000 කි. (මෙයින් රු. 12 000 ක සැප්තැම්බර් මස තැන්පත් කර ඇත. ඔක්තෝම්බර් මාසයේ තැන්පත් කළ චෙක්පත්වලින් 25 000 උපලබ්ධි වී නැත.)
- මාසය තුළ අය කළ බැංකු ගාස්තු රු 5 000 ක් හා සෘජු ප්‍රේෂණ රු 10 000 ක් වේ.

ඒ අනුව 2024-10-31 දිනට ව්‍යාපාර මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ,

| | මුදල් ගිණුමේ සංශෝධන ශේෂය (රු.) | බැංකු ප්‍රකාශනයේ ශේෂය (රු.) |
|---|---|---|
| 1. | 7 000 අයිරාවකි | 22 0000 අයිරාවකි |
| 2. | 7 000 අයිරාවකි | 8 000 |
| 3. | 10 000 | 5 000 අයිරාවකි |
| 4. | 20 000 | 5 000 |
| 5. | 26 000 | 20 000 |

(...........)

(09) ගැණුම් වියදමක් ලෙස ගිණුම්ගත කළ ද එය සත්‍ය වශයෙන් වියදමක් වන්නේ, පහත කුමන අවස්ථාවේ දී ද?

1. භාණ්ඩ මිල දී ගත් අවස්ථාවේ දී
2. භාණ්ඩ විකුණන ලද අවස්ථාවේ දී
3. විකුණූ භාණ්ඩ ගබඩාවෙන් පිටකළ අවස්ථාවේ දී
4. භාණ්ඩවලට මුදල් ලැබුණු අවස්ථාවේ දී
5. භාණ්ඩ ගබඩාවෙන් පිටකළ අවස්ථාවේ දී (...........)

- **පහත තොරතුරු ඇසුරින් අංක 10, 11, 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සමාගමක 2024-10-31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු 400 000 ක් වූ අතර ණයහිමි ලෙජරයේ ශේෂ එකතුව මීට වෙනස් විය. පසුව පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

(i) ගැනුම් ජ'නලයේ එකතුව රු 75 000 ණයහිමි පාලන ගිණුමට පිටපත් කර ඇත්තේ රු 57 000 ලෙසිණි.

(ii) රු 25 000 ක ආපසු යැවුම් උප ලෙජර ගිණුමේ සටහන් කර නැත.

(iii) ණයහිමි ගෙවීම් රු 20 000 පාලන ගිණුමේ වැරදි පැත්තේ සටහන් කර ඇත.

(iv) රු 20 000 ගැනුම් මූලික පොතේ දෙවරක් සටහන් කර ඇත.

(v) ලද වට්ටම් රු 15 000 ණයහිමි පාලන ගිණුමේ සටහන් කර නැත.

(10) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ශේස පිරික්සුමේ විවෘත කළ අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ,

1. රු. 7 000 හර  2. රු. 17 000 හර  3. රු. 37 000 හර
4. රු. 42 000 හර  5. රු. 62 000 හර (...........)

(11) වැරදි නිවැරදි කිරීමට පෙර ණයහිමි ලෙජර ශේෂ ලැයිස්තු එකතුව වන්නේ,

1. රු 370 000  2. රු. 388 000  3. රු. 403 000
4. රු. 408 000  5. රු. 412 000 (...........)

(12) 2024-10-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු නිවැරදි ණය හිමි ශේෂය වන්නේ,

1. රු. 343 000  2. රු. 360 000  3. රු. 373 000
4. රු. 373 000  5. රු. 475 000 (...........)

- **නිෂ්පාදන ව්‍යාපාරයක 2024 ඔක්තෝබර් මාසයට අදාළව ද ඇති තොරතුරු ඇසුරින් අංක 13, 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | රු.'000 |
|---|---|
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | 1 100 |
| සෘජු ශ්‍රම පිරිවැය | 550 |
| සෘජු වෙනත් වියදම් | ? |
| මුළු ොදු කාර්ය පිරිවැය | 300 |
| නොනිමි තොග අඩු වීම | 100 |
| අමු ද්‍රව්‍ය තොග වැඩි වීම | 75 |
| නිමි තොග වැඩි වීම | 50 |

අතිරේක තොරතුරු

(i) මුළු පොදු කාර්ය පිරිවැයෙන් 1/3 ක් නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය වේ.

(ii) මාසය තුළ නිෂ්පාදනය කළ ඒකක සංඛ්‍යාව 1000 කි. සෑම ඒකකයක් සඳහා රු. 100 000 පිරිවැයක් දරයි.

(iii) නිපදවන සියළු භාණ්ඩ, අලෙවි සැළට මාරු කරන අතර විකුණුම් පිරිවැයට 25% ක දළ ලාභ ආන්තිකයක් සහිතව විකුණනු ලබයි.

(13) 2024-10-31 දිනෙන් අවසන් මාසයේ ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,

| | ප්‍රාථමික පිරිවැය (රු.'000) | නිෂ්පාදන (රු.'000) |
|---|---|---|
| 1. | 1 650 | 1 950 |
| 2. | 1 675 | 1 975 |
| 3. | 1 750 | 2 050 |
| 4. | 1 750 | 2 000 |
| 5. | 1 750 | 2 100 |

(...........)

(14) 2024-10-31 දිනෙන් අවසන් මාසයේ විකුණුම් පිරිවැය හා දළ ලාභය වන්නේ,

| | විකුණුම් පිරිවැය (රු'000) | දළ ලාභය (රු'000) |
|---|---|---|
| 1. | 1 900 | 475.00 |
| 2. | 1 925 | 481.25 |
| 3. | 1 950 | 487.50 |
| 4. | 2 000 | 500.00 |
| 5. | 2 150 | 537.50 |

(...........)

(15) සුමේධගේ ව්‍යාපාරයේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ පහත තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

| | රු.'000 |
|---|---|
| ණයගැතියන් වැඩිවීම | 150 |
| ණයහිමියන් වැඩිවීම | 200 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | 1 850 |
| ණයහිමියන්ට මුදල් ගෙවීම | 1 500 |
| 2023-04-01 ට තොගය | 200 |

දළ ලාභ ආන්තිකය විකුණුම් මිලට 20% යි.

2024-03-31 දින ඇති වූ ගින්නකින් ඉතිරි තොගය සම්පූර්ණයෙන් විනාශ විය. මෙම විනාශ වූ තොගයේ පිරිවැය කොපමණ ද?

1. රු. 220 000 යි
2. රු. 300 000 යි
3. රු. 420 000 යි
4. රු. 480 000 යි
5. රු. 540 000 යි

(...........)

(16) 2023-04-01 දිනට ''එකමුතු සුහද හමුවේ'' මුළු සාමාජික සංඛ්‍යාව 100 කි. මෙයින් 05 දෙනෙකු යාවජීව සාමාජිකයෝ වන අතර යාව ජීව සාමාජික අරමුදල රු. 75 000 කි. ප්‍රවර්තන වර්ෂය ද ඇතුළත් ව වර්ෂ 5 ක් තුළ සමානව ආදායම් ලෙස හඳුනා ගනී. මාස තුනකට වරක් සිදුවන හමුවේ දී සාමාජිකයෙකුගෙන් රු. 500 ක් බැගින් සාමාජික මුදල් එකතු කරයි.

2023-03-31 දිනට හා 2024-03-31 දිනට එක් හමුවීම වාරයක් වෙනුවෙන් සාමාජික මුදල් ඉදිරියට ලද ලැබිය යුතු සාමාජික සංඛ්‍යාව පහත පරිදි වේ.

| | 2023-03-31 දිනට | 2024-03-31 දිනට |
|---|---|---|
| උපචිත සාමාජික සංඛ්‍යාව | 10 | 15 |
| ඉදිරියට ලද සාමාජික සංඛ්‍යාව | 12 | 20 |

2024-03-31 න් අවසන් වර්ෂය තුළ ලද සාමාජික මුදල් වටිනාකම හා යාව ජීව සාමාජික මුදල ඇතුළුව මුළු සාමාජික මුදල් ආදායම වන්නේ,

| | වර්ෂය තුළ ලද සාමාජික මුදල් (රු.) | වර්ෂයේ මුළු සාමාජික මුදල් ආදායම (රු.) |
|---|---|---|
| 1. | 188 500 | 203 500 |
| 2. | 188 500 | 205 000 |
| 3. | 191 500 | 206 500 |
| 4. | 191 500 | 205 000 |
| 5. | 191 500 | 215 000 |

(...........)

(17) හවුල්කරුවකු ප්‍රාග්ධණයට අමතරව ලබා දෙන ණය මුදලක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අතර එකඟ විය නොහැකි ප්‍රකාශය හෝ ප්‍රකාශ වන්නේ,

(A) හවුල්කරුවන්ගෙන් ණය ලබා ගැනීම ව්‍යාපාර හා හවුල්කරුවන් අතර සිදුවන ගනුදෙනුවකි.

(B) ණය සඳහා පොළිය හවුල්කරුවන් අතර ලාභය බෙදා ගැනීමේ ආකාරයකි.

(C) ණය මුදල හවුල් ව්‍යාපාරයේ හිමිකමේ කොටසකි.

(D) හවුල් ආඥා පනතට අනුව ණය සඳහා 10% ක වර්ෂික පොළියක් ගෙවිය යුතුය.

1. B පමණි 2. C පමණි 3. B හා D පමණි
4. A, B හා C පමණි 4. A, B, C, D යන සියල්ලම (...........)

**1● පහත තොරතුරු ඇසුරින් අංක 18 හා19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන අමල් හා බිමල් හවුල් ව්‍යාපාරයේ 2023-04-01 දින 1/6 ක හිමිකමකට යටත්ව නව හවුල්කරුවකු වශයෙන් චමල් බඳවා ගැනීම නිමිති කරගෙන කීර්තිනාමය තක්සේරු කර ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපීමට තීරණය විය. තවද ඔහු තම ප්‍රාග්ධනය හා කීර්තිනාම කොටස සඳහා රු. 1 020 000 ක් මුදලින් ගෙන එන ලදී. නව හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ද ඇතුළත්වේ.

(i) ගලපන ලද ප්‍රාග්ධන ශේෂ සඳහා 10% ක වාර්ෂික පොළියක් ගෙවීම

(ii) සෑම හවුල්කරුවකුටම රු. 240 000 ක වාර්ෂික වේතන ගෙවීම

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ.

| | 2023-03-31 දිනට රු.'000 | | | 2024-03-31 දිනට රු'000 | | |
|---|---|---|---|---|---|---|
| | අමල් | බිමල් | චමල් | අමල් | බිමල් | චමල් |
| ප්‍රාග්ධන ගිණුම් ශේෂ | 2 988 | 1 492 | - | 3 000 | ? | ? |
| ජංගම ගිණුම් ශේෂ | 400 | 250 | - | ? | ? | 390 |

(18) 2023-04-01 දින තක්සේරු කරන ලද කීර්තිනාම වටිනාකම වන්නේ,

1. රු. 24 000 යි. 2. රු. 48 000 යි. 3. රු. 72 000 යි.
4. රු. 100 000 යි. 5. රු. 120 000 යි. (...........)

(19) 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ හවුල් ව්‍යාපාරය උපයන ලද ශුද්ධ ලාභය වන්නේ,

1. රු 300 000 2. රු. 550 000 3. රු. 720 000
4. රු. 1 020 000 5. රු. 1 570 000 (...........)

(20) සමාගමක ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙලින් වාර 2 ක් හා වාර 1.5 ක් විය. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී භාණ්ඩ ණයට මිල දී ගැනීමක් තුලින් මෙම අනුපාත දෙකට ඇති කරන බලපෑම කුමක් ද?

| | ජංගම අනුපාතය | ක්ෂණික අනුපාතය |
|---|---|---|
| 1. | වැඩි වේ | වැඩි වේ |
| 2. | වැඩි වේ | අඩු වේ |
| 3. | අඩු වේ | අඩු වේ |
| 4. | අඩු වේ | වැඩි වේ |
| 5. | වෙනස් නොවේ | වෙනස් නොවේ |

(...........)

(21) සී/ස සමාගමක 2024-03-31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන අතර 2024-06-15 දින අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තා අනුමාන කරන ලදී. අනුමැතියට පෙර පහත ගනුදෙනු සිදුවී ඇත.

A - 2024-04-30 දින ණයට විකුණු ණයගැතියෙකු 2024-05-31 දින මිය යාම
B - 2024-03-31 දිනට තිබූ රු 150 000 තොගයක් ගිනිගෙන විනාශ වීම
C - 2024-03-31 දිනට රු. 350 000 වන්දියක් ඉල්ලා ගොනුකර තිබූ නඩුවක තීරණයට අනුව 2024-06-01 දින රු. 450 000 වන්දියක් ගෙවීම

වාර්තාකරන දිනට පසු සිදුවීම් (LKAS 10) ප්‍රමිතියට අනුව නොගලපන සිදුවීම් ඇතුළත් පිළිතුර වන්නේ,

1. A පමණි 2. B පමණි 3. AB පමණි
4. BC පමණි 5. ABC සියල්ලම (...........)

- **පහත තොරතුරු ඇසුරින් අංක 22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සීමිත වික්‍රම සමාගම 2023-04-01 දින යතුරු පැදියක් සීමිත අශෝක සමාගමෙන් කල්බදු ක්‍රමයට ලබාගත් අතර එදින රු. 220 000 මූලික ගෙවීමක් කරන ලදී. ගැනුම්කරු රු. 19 720 ක සෘජු පිරිවැය දරා ඇත. මෙම වත්කමේ ඵලදායි ජීව කාලය වසර 5 අවසානයේ සුන්බුන් අගය රු. 20 000 කි. ණය මුදල 2024-03-31 දිනෙන් ආරම්භ කර රු. 120 000 බැගින් වූ වාර්ෂික වාරික 4 ක් ගෙවීමෙන් පසු වත්කමේ අයිතිය ගැනුම්කරුට මාරුවේ. කල්බදු ණය මුදලේ මුළු පොළිය රු. 99 720 කි. ගම්‍ය පොළී අනුපාතය 10% කි.

(22) "SLFRS-16 කල්බදු ''ප්‍රමිතියට අනුව 2024-03-31 දිනට කල්බදු ණයහිමි වටිනාකම වන්නේ,

1. රු. 99 720 2. රු. 380 280 3. රු. 480 000
4. රු. 600 000 5. රු. 620 000 (...........)

(23) "LKAS -16 දේපළ පිරියත උපකරණ'' ප්‍රමිතයට අනුව 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාවිත අයිතිය ඇති යතුරු පැදියේ ක්ෂය

1. රු. 92 000 2. රු. 96 000 3. රු. 115 000
4. රු. 120 000 5. රු. 150 000 (...........)

(24) සී/ස සමාගමක 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ තොග පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාණ්ඩය | අයිතිමය | පිරිවැය (රු.'000) | ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය (රු.'000) |
|---|---|---|---|
| P | 1 | 1 500 | 1 600 |
| | 2 | 1 300 | 1 200 |
| Q | 3 | 900 | 650 |
| | 4 | 600 | 750 |
| එකතුව | | 4 300 | 4 200 |

කාණ්ඩ ක්‍රමයට තොග අගය කරන්නේ නම් 2024-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොගයේ වටිනාකම දහස්වලින් (රු.'000) කොපමණ ද?

1. රු. 1 500 2. රු. 3 950 3. රු. 4 100
4. රු. 4 200 5. රු. 4 300 (...........)

(25) සීමිත සුමේධා සමාගමේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ පහත තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

| විස්තරය | රු.'000 |
|---|---|
| විකුණුම් | 900 |
| විකුණුම් පිරිවැය | 500 |
| මෙහෙයුම් වියදම් (ප්‍රත්‍යාගණනයන් නොගලපන ලද) | 175 |
| ආදායම් බදු | 50 |

වර්ෂය තුළ දී ඉඩම ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් රු 100 000 අතිරික්තයක් ද මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් රු. 60 000 ක අතිරික්තයක් ඇති විය. මෝටර් රථ පළමු වරට පත්‍යාගණනයේ දී රු. 25 000 ක ඌනතාවයක් පැන නැගී ඇත.

2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ ලාභය හා වෙනත් විස්තීරණ ආදායම වන්නේ,

| | වර්ෂයේ ලාභය (රු'000) | වෙනත් විස්තීරණ ආදායම (රු'000) |
|---|---|---|
| 1. | 175 | 135 |
| 2. | 175 | 335 |
| 3. | 200 | 100 |
| 4. | 200 | 135 |
| 5. | 200 | 235 |

(...........)

(26) පහත සඳහන් කවර සිද්ධීන් සමාගමක හිමිකම වෙනස්වීමට හේතුවේද?

A හිමිකම් නිකුතුවක් කිරීම

B සංචිත ප්‍රාග්ධනිත කිරීම

C සාමාන්‍ය කොටස් හිමියන්ට අවසන් ලාභාංශයක් ප්‍රකාශ කිරීම

D පොදු සංචිතයට මාරු කිරීම

1. A පමණි 2. B පමණි 3. C පමණි
4. B,C හා D පමණි 5. A,B,C,D සියල්ලම (...........)

(27) සීමිත ජනහිත සමාගමේ 2024-03-31 දිනෙන් අවසන් වර්ෂයේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

| | රු.'000 |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 1500 |
| තොග වැඩි වීම | 25 |
| වෙළඳ ලැබිය යුතු දෑ වැඩි වීම | 40 |
| වෙළඳ ගෙවිය යුතු දෑ අඩු වීම | 30 |
| වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු | 250 |
| වාර්ෂික ක්ෂය | 100 |
| යන්ත්‍ර විකිණීමෙන් ලද ලාභය | 55 |
| ගෙවූ ණය පොලී | 50 |

2024-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ බදු පෙර ලාභය රුපියල් දහස්වලින් (රු'000) දැක්වෙන්නේ,

1. රු. 1 745 2. රු. 1 755 3. රු. 1 850
4. රු. 1 900 5. රු. 1 950 (...........)

(28) "X" නිෂ්පාදනයට අදාළ ව පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | |
|---|---|
| මාසික පරිභෝජනය | ඒකක 12 000 යි |
| එක් ඇනවුමක පිරිවැය | රු 500 |
| ඒකකයක පිරිවැය | රු 20 |

තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකක පිරිවැයෙන් 5% කි.

ඉහත තොරතුරු අනුව ආර්ථික ඇනවුම් ප්‍රමාණය (EOQ) වන්නේ,

1. ඒකක 10 000 2. ඒකක 12 000 3. ඒකක 12 500
4. ඒකක 15 000 5. ඒකක 50 000 (...........)

(29) සමාගමක සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක 3 000 කි. ඒකකයක විකුණුම් මිල රු 200 ක් හා ඒකකයක විචල්‍ය පිරිවැය අනුපාතය 62.5% කි.

ස්ථාවර පිරිවැය හා රු. 150 000 ක අපේක්ෂිත ලාභයක් ලැබීමට විකිණිය යුතු ඒකක ගණන වනුයේ,

| | ස්ථාවර පිරිවැය රු | විකිණිය යුතු ඒකක ගණන |
|---|---|---|
| 1. | 225 000 | 3 000 |
| 2. | 225 000 | 5 000 |
| 3. | 375 000 | 5 000 |
| 4. | 375 000 | 7 000 |
| 5. | 600 000 | 10 000 |

(...........)

(30) සීමිත ලක්මාල් සමාගම රු. 7 800 000 ක් නව යන්ත්‍රයක් මිලට ගැනීමට අපේක්ෂාවෙන් සිටී. මෙම නව යන්ත්‍රය නිසා සේවකයන් 5 දෙනෙකුගේ සේවය අවශ්‍ය නොවන අතර ඔවුන් වෙනත් කාර්යයකට අනුයුක්ත කළ හැකි වේ. කෙසේ වුවද සේවකයෙක් සඳහා මසකට රු. 40 000 ක වැටුපක් සාමාන්‍යයෙන් ගෙවීමට සිදුවේ. ඉහත ආයෝජනයේ පිලිගෙවුම් කාලය කොපමණ ද?

1. අවු. 3
2. අවු. 3 මාස 3
3. අවු. 3 මාස 4
4. අවු. 4
5. අවු. 4 මාස 3

(...........)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(31) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව වාර්තාකරණ ඒකකයක මූල්‍ය වාර්තා භාවිතා කරන්නන්ට අයත් පාර්ශව වන්නේ,

1. ............................................................ 2. ............................................................
3. ............................................................ 4. ............................................................

(32) මූල්‍ය ප්‍රකාශන මූලිකාංගවලට අයත් වන්නේ,

1. ............................................................ 2. ............................................................
3. ............................................................ 4. ............................................................

(33) 2023-04-01 දින මානෙල් විසින් රු. 250 000 ප්‍රාග්ධනය ලෙස යොදා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

1. වර්ෂය තුළ මානෙල් විසින් රු. 150 000 අමතර ප්‍රාග්ධනයක් යොදා ඇති අතර රු. 50 000 ගැනිලි සිදුකර ඇත.
2. 24-03-31 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් රු. 860 000 හා රු. 210 000 කි.

අ) 2024-03-31 දිනට ව්‍යාපාරයේ ලාභය රු. ..........................................................................................

ආ) 2024-03-31 දිනට හිමිකම රු. ..........................................................................................

(34) අමාලි ලී බඩු වෙළඳ සැලේ පහත ගනුදෙනු සිදු වී ඇත.

A - රු 500 000 ලී බඩු තොග ණයට ගැනීම
B - රු 250 000 බැංකු ණයක් ලබා ගැනීම
C - සුළු මුදල් අග්‍රිමය රු. 15 000 ගෙවීම
D - රු 12 500 නිකුත් කළ චෙක්පත් අගරු වීම

ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලේඛණ හා උපයෝගී පොත් සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛණය | උපයෝගී පොත |
|---|---|---|
| A | ...................................... | ................................................. |
| B | ...................................... | ................................................. |
| C | ...................................... | ................................................. |
| D | ...................................... | ................................................. |

(35) පහත ගනුදෙනු මගින් ව්‍යාපාරයක ණයගැති පාලන ශේෂය අඩුවේද, වැඩිවේද, වෙනස් නොවේද යන්න දක්වන්න.

අඩුවේ / වැඩි වේ / වෙනස්වේ

1. රු. 150 000 තොගයක් ණයට විකිණීම ..................................................
2. රු. 60 000 චෙක්පතක් ණයගැතියන්ගේ ලැබීම ..................................................
3. රු 25 000 ණයගැතියෙකු ණයහිමියෙකු සමඟ හිලව් කිරීම ..................................................
4. රු. 50 000 හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම ..................................................

(36) මාලිකා සමාගමේ 2024-03-31 දිනට සකස් කළ මූල්‍ය ප්‍රකාශනවලින් රු. 540 000 කෙටුම්පත් ලාභයක් ලැබී තිබූ අතර පහත ගිණුම්කරණ වැරදි සිදු වී තිබුණි.

A - රු. 15 000 ලද වට්ටම් දුන් වට්ටම් ගිණුමට හර කර ඇත.

B - රු. 3000 භාණ්ඩ පරිත්‍යාග ගිණුම්වල සටහන් කර නැත.

C - රු. 6000 මුදල් ගැනිලි 60 000 ලෙස පොත්වල ලියා ඇත.

D - රු 80 000 ප්‍රචාරණ වියදම් මුදල් ගිණුමේ පමණක් ලියා ඇත.

ඉහත වැරදි නිවැරදි කළ පසු නිවැරදි ලාභය ..................................................................................................................

(37) රන්තරු ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථාව අනුව කිසියම් සාමාජිකයකු වසර දෙකක් අඛණ්ඩව සාමාජික මුදල් නොගෙවූ විට ඔහු සාමාජිකත්වය කපා හරිනු ලැබේ. සාමාජිකත්වය අහෝසි කළ සාමාජිකයන්ගේ හිඟ සාමාජික මුදල් කපා හැරීමේ ද්විත්ව සටහන ලියන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(38) 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියට අනුව පහත ප්‍රකාශන සත්‍ය, අසත්‍ය බව දක්වන්න.

A - හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ සඳහා පොලි ගෙවනු ලැබේ. ..........................

B - විශ්‍රාම ගිය හවුල්කරුවන්ගේ ණය මුදලක් වේ නම් ඒ සඳහා 5% පොලී ගෙවිය යුතුය. ..........................

C - හවුල්කරුවන් වේතන සඳහා හිමිකම් නොලබයි. ..........................

D - සියළුම හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක විය යුතුය. ..........................

(39) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශණ මූලිකාංග හඳුනා ගැනීමේ නිර්නායක 02 ක වන්නේ,

1. .................................................................... 2. ....................................................................

(40) 2020-04-01 දින රු. 800 000 මිලට ගත් මෝටර් රථයක් වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ. 2023-04-01 දින රු. 160 000 නවීකරණ වියදමක් දරන ලද අතර එම නිසා මෝටර් රථයේ ඵලදායී ජීව කාලය වසරකින් ඉහළ යන ලදී.

ආ) 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ........................

ආ) 2024-03-31 දිනට මෝටරරථයේ ධාරන අගය ...................................................................................

(41) 2022-04-01 දින මූල්‍ය කල්බදු පදනමට මිලට ගත් යන්ත්‍රයක් පිළිබඳ පහත තොරතුරු සැපයේ.

| | | |
|---|---|---|
| යන්ත්‍රයේ සාධාරණ අගය | රු. | 1 400 000 |
| මූලික තැන්පතු ගෙවීම | රු. | 200 000 |
| ඵලදායි ජීව කාලය වසර 10 | | |
| ගම්‍ය පොලී අනුපාතය 10% | | |
| වාර්ෂික කල්බදු වාරිකය | රු. | 250 000 |

අ) 2024-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු භාවිත අයිතිය සහිත වත්කම්වල අගය ..........................................................................................................................................

ආ) 2024-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ ජංගම වගකීම් යටතේ දැක්විය යුතු කල්බදු වගකීම ..........................................................................................................................................

(42) ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් ඇතිවන අයභාරය (SLFRS 15) ප්‍රමිතියට අනුව පොරොන්දු වූ භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ගනුදෙනුකරුගෙන් අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම (1) ........................................................ ලෙස හඳුන්වන අතර පොරොන්දු වූ භාණ්ඩ හා සේවා ගනුදෙනුකරුට සැපයීම මගින් (2) ............................................... තෘප්තිමත් කළ විට අයභාරය හඳුනා ගනී.

(43) මුදල් ප්‍රවාහ ප්‍රකාශන (LKAS 07) ප්‍රමිතියට අනුව පහත මුදල් ප්‍රවාහයන් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ලෙස (v) යොදා පෙන්වන්න.

| | | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|---|
| A | කොටස් නිකුත් කිරීම | .......................... | .............................. | .......................... |
| B | මෙහෙයුම් වියදම් ගෙවීම | .......................... | .............................. | .......................... |
| C | ලැබූ ලාභාංශ ආදායම් | .......................... | .............................. | .......................... |
| D | ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම් | .......................... | .............................. | .......................... |

- **ප්‍රශ්න අංක 44 හා 45 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

| | |
|---|---|
| 2024-03-31 දිනට සා.කො. ප්‍රාග්ධනය | රු. |
| (කොටස් 50 000) | 5000 000 |
| 2024-03-31 දිනට රඳවාගත් ඉපයුම් | 4000 000 |
| 2024-03-31 දිනට කලාච්ඡේදයේ මුළු විස්තීර්ණ ආදායම | 3000 000 |

2024-03-31 දිනට පැවති සෑම කොටස් 05 කට 01 බැගින් රු. 200 බැගින් කොටස් නිකුත් කර සංචිත ප්‍රාග්ධනිත කිරීමක් කරන ලදී.

තවද වර්ෂය තුළ දී දෙ.පි. උපකරණ ප්‍රත්‍යාගණනයෙන් රු. 1000 000 ප්‍රත්‍යාගණන ලාභයක් ලැබී ඇති අතර රු 200 000 මාරු කර පොදු සංචිතයක් ඇතිකරන ලදී.

(44) සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ද්විත්ව සටහන

..........................................................................................................................................

..........................................................................................................................................

(45) 2024-03-31 දිනට

අ) සා.කො. ප්‍රාග්ධනය රු. ..........................................................................................................

ආ) රඳවාගත් ඉපයුම් රු. ..........................................................................................................

(46) සී/ස සමාගමක ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය සම්බන්ධව පහත ප්‍රකාශ සත්‍ය ද (T) අසත්‍යය ද (F) යන්න සඳහන් කරන්න.

| | | ප්‍රකාශය | සත්‍ය (T) / අසත්‍ය (F) |
|---|---|---|---|
| A | - | ජංගම වත්කම් හා ජංගම වගකීම් සමාන ප්‍රමාණයකින් වැඩි වූ විට ජංගම අනුපාතයේ අගය වෙනස් නොවේ. | ................................ |
| B | - | ණය අනුපාතයේ අගය 50% වූ විට සම තෝලන අවස්ථාවක් පෙන්නුම් කෙරේ. | ................................ |
| C | - | තොග පිරිවැටුම් අනුපාතය ඉහළ යන විට තොග රැඳවුම් කාලය පහල යයි. | ................................ |
| D | - | අඩු පොලී ආවරණ අනුපාතයක්, අඩු ණය ගෙවීමේ හැකියාවක් පෙන්නුම් කරයි. | ................................ |

(47) ආයතනයක භාවිතා කරනු ලබන අමුද්‍රව්‍යවකට අදාළව පහත තොරතුරු දැකිය හැකිය.

| | උපරිම | අවම |
|---|---|---|
| පරිභෝජනය (ඒකක) | 150 | 70 |
| පොරොත්තු කාලය (සති) | 5 | 3 |
| ආර්ථික ඇනවුම් ප්‍රමාණය | | 810 |

මෙම ද්‍රව්‍යයේ සාමාන්‍ය තොග මට්ටම කොපමණ ද? ................................................................................................

(48) නිෂ්පාදන ව්‍යාපාරයක පහත තොරතුරු දැකිය හැකි විය.
නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ මුළු පොදුකාර්ය පිරිවැය රු. 260 000
එකලස් දෙපාර්තමේන්තුවේ මුළු පොදුකාර්ය පිරිවැය රු. 160 000

| ඒකකයක පොදුකාර්ය පිරිවැය රු. | අවශ්‍ය පැය |
|---|---|
| නිෂ්පාදන - 20 | 4 |
| එකලස් - 12 | 3 |

අ) නිෂ්පාදන දෙපාතර්මේන්තුවල පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත
නිෂ්පාදන රු. ................................................................................................................................
එකලස් රු. ................................................................................................................................

ආ) නිෂ්පාදන අංශය යන්ත්‍ර පැය ගණන අනුවත් එකලස් අංශය ශ්‍රම ගණන අනුවත් පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයිනම් නිෂ්පාදන දෙපාර්තමේන්තුවල අයවැය ගත පැය ප්‍රමාණයන් කොපමණ ද?
යන්ත්‍ර පැය ................................................................................................................................
ශ්‍රම පැය ................................................................................................................................

(49) තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන සමාගමක් පිළිබඳ පහත තොරතුරු දැකිය හැකිය.

| නිෂ්පාදන ඒකක ගණන | ඒකකයක පිරිවැය |
|---|---|
| 5000 | 120 |
| 8000 | 97.5 |

අ) මුළු ස්ථාවර පිරිවැය රු. ................................................................................................
ආ) ඒකකයක විචල්‍ය පිරිවැය රු. ................................................................................................

(50) ආයෝජන තීරණ සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සත්‍ය ද(T) / අසත්‍ය ද (F) යන්න දක්වන්න.

| | | | සත්‍ය (T) / අසත්‍ය (F) |
|---|---|---|---|
| A | - | වාර්ෂික මෙහෙයුම් වියදම් වැඩි වූ විට ශුද්ධ වර්තමාන අගය වැඩිවේ. | ................................ |
| B | - | පිළිගෙවුම් කාලය වැඩි ආයෝජනයක් තෝරා ගනු ලබයි. | ................................ |
| C | - | වට්ටම් සාධකයේ අගය අඩු වන විට ශුද්ධ වර්තමාන අගය වැඩිවේ. | ................................ |
| D | - | ආයෝජන ප්‍රතිලාභ අනුපාත ක්‍රමයේ දී මුදලේ කාල වටිනාකම සැලකිල්ලට නොගනී. | ................................ |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ....................................

# ගිණුම්කරණය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න .
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න..

(01) සීමිත සුරංජිත් පොදු සමාගම නිෂ්පාදන සමාගමක් වන අතර, එය තනි භාණ්ඩයක් නිපදවයි. 2024-03-31 දිනට සාරාංශ ගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.000) | බැර (රු.000) |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ ධාරණ වටිනාකම | 42 200 | |
| අමු ද්‍රව්‍ය | 1 400 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 9 500 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 6 640 |
| භාවිත අයිතිය සහිත වත්කම - යන්ත්‍ර | 2 500 | |
| කල්බදු වගකීම යන්ත්‍ර | | 1 700 |
| ගෙවිය යුතු EPF (සේවක) | | 96 |
| ගෙවූ බදු | 1 050 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 250000) | | 25 000 |
| 2023-04-01 දිනට රඳවාගත් ඉපයුම් | | 14 500 |
| ප්‍රත්‍යාගණන සංචිතය - ඉඩම් | | 500 |
| 2023-04-01 දිනට නිමි තොගය | 800 | |
| වන්දි ප්‍රතිපාදන - පරිසර අධිකාරිය | | 200 |
| නිෂ්පාදන පිරිවැය | 32 700 | |
| බෙදා හැරීමේ පිරිවැය | 6 180 | |
| පරිපාලන වියදම් | 9 206 | |
| වෙනත් පිරිවැය | 2 100 | |
| මූල්‍ය පිරිවැය | 1 800 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 400 | |
| 2023-04-01 දිනට ආදායම් බදු ප්‍රතිපාදන | | 1 100 |
| 2023-04-01 දිනට වගකීම් සහතික ප්‍රතිපාදන | | 400 |
| විකුණුම් | | 59 700 |
| | 109 836 | 109 836 |

අතිරේක තොරතුරු :

2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතුවේ.

(i) සමාගම වර්ෂය තුළ නිෂ්පාදනය කළ ඒකක සංඛ්‍යාව 16000 කි. නිෂ්පාදන පිරිවැය ගනනය කිරීමේ දී 2024-03-31 දිනට පැවති රු. 200000 ක නොනිමි තොගයේ වටිනාකම සැලකිල්ලට ගෙන නොමැත. නොනිමි තොග නිෂ්පාදන පිරිවැයට අගය කිරීම කළ යුතුය. 2024-03-31 දිනට නිමි භාණ්ඩ තොග ඒකක 500 ක් විය.

(ii) 2023-04-01 දින නිෂ්පාදන කටයුතු සඳහා කල්බදු පදනම යටතේ යන්ත්‍රයක් වසර 5ක් භාවිත අයිති සඳහා ලබා ගෙන ඇත. මෙහි මූලික තැම්පතුව ලෙස ගෙවූ රු. 800,000 ක් හා යන්ත්‍රය සවි කිරීමේ වියදම් ලෙස වැය වූ රු. 200,000 ක මුදල නිෂ්පාදන පොදු කාර්ය වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. කල්බදු වාරික ගෙවීම්වල වර්තමාන අගය රු. 2,500,000 ක් වූ අතර එය නිවැරදිව ගිණුම්ගත කර ඇත. පළමු හා දෙවන වසරේ කල්බදු පොලිය පිළිවෙලින් රු. 500,000 ක් හා රු. 400,000 ක් වේ. රු.800,000 ක් වූ වාර්ෂික කල්බදු වාරිකය ප්‍රවර්තන වර්ෂය තුළ දී ගෙවා කල්බදු ණයහිමි ගිණුමට හර කිරීම හැර ඊට අදාළ පොලිය ගිණුම්ගත කර නැත. කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය සමාගමට පැවරේ. යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 7 කි. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී කල්බදු යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය සැලකිල්ලට ගෙන නොමැත.

(iii) පරිපාලන වියදම් තුළ වැටුප් හා වේතන රු. 2,400,000 ක් ඇතුළත් වන අතර, EPF හා ETF දායකයන් මාස 6 ක් සඳහා ගෙවා එය පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ. අවසන් මාස හය සඳහා සේවා යෝජක EPF හා ETF දායකයන් ගෙවා හෝ ගිණුම්ගත කිරීමක් නොමැත. සේවා යෝජක EPF හා ETF දායක අනුපාතයන් පිළිවෙලින් 12% ක් හා 3% ක් වේ.

(iv) 2024-03-31 දිනට දේපළ පිරියත හා උපකරණවලට අදාළ තොරතුරු පහත වේ.

| විස්තර | පිරිවැය / අගය (රු.'000) | ධාරණ වටිනාකම (රු.'000) |
|---|---|---|
| ඉඩම | 8000 | 8000 |
| කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල | 24000 | 21600 |
| නිෂ්පාදන පිරියත | 18000 | 9000 |
| කාර්යාල උපකරණ | 6000 | 3600 |
| | 56000 | 42200 |

වර්ෂය තුළ දී දේපළ පිරියත හා උපකරණ මිල දී ගැනීමක් හෝ විකිණීමක් / ඉවත් කිරීමත් සිදුකර නොමැත.

නිෂ්පාදන පිරියත හා කාර්යාල උපකරණ පිලිවෙලින් 10% ක් හා 5% බැගින් වාර්ෂිකව පිරිවැය මත ක්ෂය කරයි. වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(v) 2023-04-01 දින ඉඩම් හා කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වෘත්තීය තක්සේරුකර ආයතනයක් විසින් ප්‍රථම වරට ප්‍රත්‍යාගනනය කිරීමෙන් පහත වෙනස් වීම් සිදු වී ඇත.

* ඉඩම ප්‍රත්‍යාගනනයෙන් අතිරික්තයක් ලද අතර එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.
* කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනයෙන් ඌණතාවයක් වාර්තා විය.

ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිල්ලේ පිරිවැය රු 42000000 ක් හා ඵලදායි ජීවකාලය වසර 25 ක් විය. 2023-04-01 දින වන විට වසර 10 ක් භාවිත කර ඇත. ප්‍රත්‍යාගනනයෙන් පසු මෙම ගොඩනැගිල්ල තවදුරටත් භාවිත කළ හැක්කේ වසර 10 ක් බවට ඇස්තමේන්තු කරන ලදී. මෙම සියලු වෙනස්වීම් සැලකිල්ලට ගෙන ප්‍රත්‍යාගනනය හා ක්ෂය වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(vi) වර්තමාන විකුණුම් වටිනාකම මත රු. 550000 ක වගකීම් සහතික ප්‍රතිපාදනයක් ප්‍රවර්තන වර්ෂය සඳහා සිදු කළ යුතුය. පසුගිය වසර තුළ කරන ලද විකුණුම් සඳහා වූ රු. 80000 ක අළුත් වැඩියා වියදමක් වර්ෂය තුළ දී ගෙවා බෙදා හැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත.

(vii) පෙර වර්ෂයේ ආදායම් බද්ද වර්ෂය තුළ දී මුදලින් ගෙවා ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද රු. 1250000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2024-03-31 දින එදිනෙට පැවති සෑම සාමාන්‍ය කොටස් 5 කටම 1 බැගින් කොටසක් රු. 100 ක ප්‍රතිෂ්ඨාවක් යටතේ හිමිකම් නිකුතුවක් සිදුකර තිබුණ ද ඒ පිළිබඳ කිසිදු සටහනක් තබා නොමැත.

(ix) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂකවරුන් විසින් 2024-06-30 දින අනුමැතිය ලබා දුන් පරිසර අධිකාරිය විසින් වර්ෂය තුල දී සමාගමට විරුද්ධව පවරා තිබූ නඩුවක අධිකරණ තීන්දුව 2024-05-10 දින ලැබී, ගෙවීමට නියම වූ වන්දිය රු. 250,000 ක මුදල එදිනම ගෙවන ලදී.

(x) වර්ෂය තුළ දී ගෙවන ලද රු. 800,000 ක අධ්‍යක්ෂ ගාස්තු හා රු 360,000 ක විගණන ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ.

අවශ්‍ය වන්නේ,

LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුරංජිත් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1. 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2. 2024-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
3. 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (ලකුණු 40)

(02) අ) සී/ස නලීන් නිෂ්පාදන සමාගමේ 2024 මාර්තු මාසයේ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන ලද අමුද්‍රව්‍ය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | ඒකක ප්‍රමාණය | ඒකකයක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 03/01 | ශේෂය | 500 | 100 |
| 03/08 | මිලට ගැනීම් | 1500 | 120 |
| 03/12 | නිකුත් කිරීම් | 1200 | ? |
| 03/16 | මිලට ගැනීම් | 800 | 145 |
| 03/20 | නිකුත් කිරීම් | 1000 | ? |

අවශ්‍ය වන්නේ,

i) පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමයට මාර්තු මස ගබඩා ලෙජරය සකස් කරන්න.

ii) බරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට මාර්තු මස ගබඩා ලෙජරය සකස් කරන්න. (ලකුණු 16)

ආ) සී/ස රියල් බායිස් සමාගම සෙල්ලම් කාර් නිපදවන සමාගමක් වන අතර නිමැවුම් හා ඇසුරුම් ලෙස නිෂ්පාදන අංශ දෙකකින් සමන්විත කර්මාන්ත ශාලාවකින් සහ ගබඩා නම් සේවා අංශයකින් සමන්විත වේ. සමාගමේ ඊලඟ වර්ෂයේ ඇස්තමේන්තු පොදු කාර්ය පිරිවැය පහත පරිදි වේ.

i) පිරිවැය අයිතමය (රු.000)

| | | |
|---|---|---|
| කුලී හා වරිපනම් බදු - | කර්මාන්තශාලාව | 250 |
| | ගබඩාව | 75 |
| කර්මාන්තශාලා රක්ෂණය - | නිමැවුම් අංශය | 155 |
| | ඇසුරුම් අංශය | 40 |
| යන්ත්‍ර ක්ෂය | | 800 |
| විදුලි වියදම් | | 350 |
| ආපනශාලා වියදම් | | 210 |
| | | 1880 |

ii) නිෂ්පාදන අංශ පිළිබඳ තොරතුරු

| | නිමැවුම් | එකලස් | ගබඩා |
|---|---|---|---|
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 8000 | 4000 | 2000 |
| යන්ත්‍ර (පිරිවැය) රු. | 500000 | 200000 | 100000 |
| කිලෝවොට් පැය | 500 | 500 | 250 |
| සේවක සංඛ්‍යාව | 40 | 20 | 10 |
| අයවැයගත යන්ත්‍ර පැය | 16000 | 2000 | - |
| අයවැයගත ශ්‍රම පැය | 4000 | 12000 | - |
| ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව | 9000 | 6000 | - |

